සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

උපදෙස් :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 40 ක් හිමි වේ.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 2 3 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ කතිර (×) ලකුණ යොදන්න.

---

01. ඇස් සම්බන්ධතාව පවත්වා ගෙන යාම අතිශයින් වැදගත් වන්නේ,
(1) අන්තර් පුද්ගල සන්නිවේදනයේදී ය. (2) කථන සන්නිවේදනයේදී ය.
(3) සමූහ සන්නිවේදනයේදී ය. (4) වාචික සන්නිවේදනයේදී ය.

02. පෝස්ටර් හා අත්පත්‍රිකා මඟින් සිදු කරන්නේ,
(1) වාචික හා දෘශ්‍ය සන්නිවේදනයකි. (2) වාචික හා නිර්වාචික සන්නිවේදනයකි.
(3) වාචික හා අවිධිමත් සන්නිවේදනයකි. (4) විධිමත් හා නිර්වාචික සන්නිවේදනයකි.

03. වර්තමානයේ ලේඛනයක පිටපතක් ලබා ගැනීම සඳහා භාවිත කරන්නේ කුමක් ද?
(1) රෝනියෝ යන්ත්‍රයයි. (2) පරිගණක මුද්‍රණ යන්ත්‍රයයි.
(3) ඩොට් මුද්‍රණ යන්ත්‍රයයි. (4) ඡායාපිටපත් යන්ත්‍රයයි.

04. සන්නිවේදනයේ කාර්යයන් අතරට ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
(1) තොරතුරු සැපයීම, සමාජානුයෝජනය, පෙළඹවීම.
(2) විනෝදාස්වාදය, පෙළඹවීම, සංස්කෘතික ප්‍රගමනය.
(3) අධ්‍යාපනය ලබා දීම, සංවාද හා සාකච්ඡා, සංජානනය.
(4) තොරතුරු සම්පාදනය, සමාජ ඒකාබද්ධතාව, සමාජානුයෝජනය.

05. ආයතනයක ප්‍රධානියෙකුගේ බලය යටතේ ක්‍රියාත්මක වන සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) අධිපතිවාදී සන්නිවේදනයයි. (2) විධිමත් සන්නිවේදනයයි.
(3) වාචික සන්නිවේදනයයි. (4) අවිධිමත් සන්නිවේදනයයි.

06. පුවත්පතක ඇති සාහිත්‍ය ලිපි, ආගමික ලිපි ආදිය අයත් වන්නේ,
(1) ප්‍රවෘත්තිවලට ය. (2) විශේෂාංග ලිපිවලට ය. (3) සංස්කාරක ලිපිවලට ය. (4) තීරු ලිපිවලට ය.

07. දෛනිකව බහුල වශයෙන් අප දෙස් විදෙස් තොරතුරු ලබා ගන්නා මූලාශ්‍රය වන්නේ,
(1) පුද්ගල මූලාශ්‍රයයි. (2) ලිඛිත මූලාශ්‍රයයි. (3) ආයතනික මූලාශ්‍රයයි. (4) මාධ්‍ය මූලාශ්‍රයයි.

08. ස්වර්ණමය රීතිය යොදා ගන්නේ,
(1) ප්‍රවෘත්ති රචනයේ දී ය. (2) නිර්මාණකරණයේ දී ය.
(3) ඡායාරූපකරණයේ දී ය. (4) තිර පිටපත් රචනයේ දී ය.

09. පුවත්පතක අන්තර්ගතයට බලපෑම් කල හැකි ලිපි ප්‍රභේදය වන්නේ කුමක් ද?
(1) ප්‍රවෘත්තිවලට ය. (2) විශේෂාංග ලිපිවලට ය.
(3) තීරු ලිපිවලට ය. (4) දැන්වීම්වලට ය.

10. ප්‍රසිද්ධ අමාත්‍යවරයෙකුගේ සොහොයුරෙකු විසින් මූල්‍යමය වංචාවක් සිදු කර ඇති බව රූපවාහිනී රාත්‍රී ප්‍රවෘත්ති මඟින් විකාශනය විය. මෙම ප්‍රවෘත්තියේ වටිනාකම තීරණය වීම කෙරෙහි වඩාත් බලපා ඇත්තේ,
(1) කාලීන බවයි. (2) අදාළ බවයි.
(3) කැපී පෙනීමයි. (4) බලපෑම හා වැදගත්කමයි.

11. බුදුදහමට අනුව සිය ආර්ථිකය කළමනාකරණය කර නොගත් තරුණ අඹු සැමි යුවළක් වස පානය කර ජීවිතක්ෂයට පත් වූ පුවතක් පුවත්පතක වාර්තා කර තිබුණි. මෙම ප්‍රවෘත්තිය මගින් නියෝජනය වන්නේ,

(1) සමාජීය නියෝජන අංශයයි. (2) ආගමික නියෝජන අංශයයි.

(3) ආර්ථික නියෝජන අංශයයි. (4) සදාචාරාත්මක නියෝජන අංශයයි.

12. රජයේ පාලනයෙන් තොරව ජෝර්ජ් ලී විසින් තොරතුරු පළ කිරීම නිසා බ්‍රිතාන්‍ය පාලකයන් විසින් වසා දැමූ පුවත්පතක් වන්නේ කුමක් ද?

(1) ලංකාලෝකය (2) ලංකාදීප

(3) කවට කතිකයා (4) ක්ලම්බු ජර්නල්

13. වර්ෂය, මාසය, දිනය, කාර්යාලයේ නම, අංශය ආදිය ඇතුළත් කරමින් සකස් කළ මාධ්‍ය උපකරණයක් වන්නේ,

(1) දින මුද්‍රා යන්ත්‍රයයි. (2) නිල මුද්‍රා යන්ත්‍රයයි.

(3) තැපැල් මුද්‍රා යන්ත්‍රයයි. (4) ජේජරයයි.

14. සන්නිවේදකයා ලබා දෙන සංදේශය නැවත සන්නිවේදකයා වෙතට නොලැබෙන විධිමත් සන්නිවේදන ආකෘතිය වන්නේ,

(1) චක්‍රීය ආකෘතියයි. (2) දාම ආකෘතියයි.

(3) වයි ආකෘතියයි. (4) රෝද ආකෘතියයි.

15. ග්‍රාමීය සමාජයේ රෝගවලින් වැළකීම සඳහා යොදා ගත් සන්නිවේදන ක්‍රමයක් නොවන්නේ,

(1) නූල් දැමීමයි. (2) සුර දැමීමයි.

(3) තහංචි කවි කීමයි. (4) කෙම්ක්‍රම භාවිතා කිරීමයි.

16. පුවත්පතක නෛතික කටයුතුවලදී වගකිම් දරන්නේ,

(1) ආයතන හිමියා ය. (2) ප්‍රධාන කර්තෘ ය.

(3) සභාපති ය. (4) ප්‍රවෘත්ති රචකයා ය.

17. පහත දැක්වෙන්නේ සන්නිවේදන වර්ගවල ලක්ෂණ කිහිපයකි.

A - අඛණ්ඩව සන්නිවේදනය සිදු වීම.

B - සන්නිවේදක, ග්‍රාහක භූමිකා තරමක් දුරස්ත වීම.

C - ග්‍රාහක පද්ධතිය පැතුරුණු ස්වභාවයක් ගැනීම.

D - ආත්ම භාෂණයට ප්‍රමුඛත්වය ලැබීම.

ඉහත ලක්ෂණවලට අදාළ සන්නිවේදන වර්ග පිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) අන්තර්වර්ති, ජන, සමූහ හා අන්තර් පුද්ගල සන්නිවේදනය.

(2) ජන,සමූහ, අන්තර් පුද්ගල හා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය.

(3) අන්තර් පුද්ගල, සමූහ, ජන හා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය.

(4) ජන,සමූහ, අන්තර්වර්තී හා අන්තර් පුද්ගල සන්නිවේදනය.

18. සංඛ්‍යාංක තාක්ෂණයේ දී ධාරිතාව මනිනු ලබන ඒකකය වන්නේ,

(1) බයිට් ය. (2) පික්සල් ය.

(3) ඇම්පියර් ය. (4) ලීටර් ය.

19. සිනමාපටයක් රූපගත කිරීමේ දී පාත්‍ර වර්ගයාගේ දර්ශනතලවල අංග රචනා, වස්ත්‍රාභරණ හා පසුතලය ආදියෙහි අඛණ්ඩතාවය පවත්වා ගැනීම සිදු කරන්නේ,

(1) ඒක් දිනයකදී රූපගත කිරීමෙනි.

(2) හොඳින් මතකයේ තබා ගැනීමෙනි.

(3) පසුතල නිර්මාණකරුවන්, වේෂ නිරූපණ ශිල්පීන් දිනපතා කැඳවීමෙනි.

(4) නිශ්චල ඡායාරූප භාවිත කිරීමෙනි.

20. නිර්මාණාත්මක වාර්තාකරණය සඳහා යොදා ගත හැකි අවස්ථාව තෝරන්න.

(1) ප්‍රබල පාතාල නායකයෙකු ඝාතනය කිරීම.

(2) අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිල ඉහළ යාම.

(3) ජපානයේ ප්‍රබල භූකම්පනයක් සිදු වීම.

(4) දිරිය දියණියක් ස්වයං රැකියාවක නිරත වෙමින් ජීවිතය ජය ගැනීම.

21. පුවත්පතක අන්තර්ගතය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය කුමක් ද?
   (1) තොරතුරු සවිස්තරාත්මක බවින් යුතු වෙයි. (2) ප්‍රවෘත්තිමය ගුණයකින් පමණක් සමන්විත වෙයි.
   (3) ජනමත ඇති කිරීමට හේතු වෙයි. (4) තත්කාලීන තොරතුරු වලින් සමන්විත වෙයි.

22. යටිකුරු පිරමීඩ සංකල්පයට අනුව තොරතුරු වාර්තාකරණයේදී
   (1) හැඳින්වීමේ සිට පිළිවෙලින් තොරතුරු ඉදිරිපත් කරයි.
   (2) වැදගත්කම ඉහළම තොරතුරේ සිට වැදගත්කම අවම වන ආකාරයට ඉදිරිපත් කරයි.
   (3) ඡායාරූපයක් සමඟ සිදුවීමේ පිළිවෙලට තොරතුරු ඉදිරිපත් කරයි.
   (4) ගවේෂණාත්මකව පිළිවෙලින් තොරතුරු ඉදිරිපත් කරයි.

23. පුවත්පත් අන්තර්ගතයෙහි ඇති නිර්මාණාත්මක ආකෘතියක් නොවන්නේ,
   (1) තීරු ලිපි (2) කාටූන්
   (3) ප්‍රවෘත්ති (4) දැන්වීම්

24. අඩු ආලෝක තත්වයක් යටතේ වුවද පැහැදිලි සාර්ථක ඡායාරූපයක් ගත හැකි වන්නේ,
   (1) නිශ්චල ඡායාරූප කැමරාවෙනි. (2) අංකිත කැමරාවෙනි.
   (3) ශ්‍රමායික කැමරාවෙනි. (4) වීඩියෝ කැමරාවෙනි.

25. සැලසුම්කරණ ඡායාරූපයක් නොවන්නේ මින් කුමක් ද?
   (1) පුවත්පත් අතිරේකයක මුල් පිටුවේ පළ කරනු ලබන ඡායාරූප
   (2) මනාල යුවලකගේ ඡායාරූප
   (3) වෙළඳ දැන්වීම ඡායාරූප
   (4) යුධමය අවස්ථාවල ඡායාරූප

26. පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. | සමාජ නියෝජනය | P | - | සමාජ ප්‍රතිරූපය |
| 2. | ආර්ථික නියෝජනය | Q | - | විනෝදාත්මක කාර්යය |
| 3. | ආගමික නියෝජනය | R | - | මානව හිමිකම් |
| 4. | සෞන්දර්යාත්මක නියෝජනය | S | - | සංවර්ධනාත්මක චින්තනය |

   නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.
   1. 1-R, 2-S, 3-P, 4-Q 2. 1-P, 2-S, 3-R, 4-Q
   3. 1-R, 2-Q, 3-P, 4-S 4. 1-Q, 2-P, 3-R, 4-S

27. රාජ්‍ය හිමිකාරිත්වය යටතේ ක්‍රියාත්මක ජනමාධ්‍ය ආයතන වන්නේ,
   (1) ලේක්හවුස් හා දෙරණ ආයතනයයි.
   (2) ලක්හඬ හා විජය පුවත්පත් ආයතනයයි.
   (3) ස්වාධීන රූපවාහිනී ආයතනය හා උපාලි පුවත්පත් ආයතනයයි.
   (4) ලක්හඬ හා ලේක්හවුස් ආයතනයයි.

28. ඓතිහාසික ස්ථාන රාශියක ඡායාරූප ධන සේයාපටලයක් මගින් ලබා ගත් රජීව ඒවා පන්ති කාමරයේ තම දරුවන්ට විශාලනය කර පෙන්වීමට තීරණය කළේය. ඒ සඳහා ඔහු භාවිතා කළ යුතු ප්‍රක්ෂේපණ යන්ත්‍රය වන්නේ,
   (1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (2) අන්තර් ක්‍රියාකාරී පුවරුවයි.
   (3) බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි. (4) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

29. වෙබ් ගුවන්විදුලිය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
   (1) ගුවන්විදුලි තරංග සම්ප්‍රේෂණයක් සිදු නොවේ.
   (2) සරල හා අවම වියදම් සහිත වේ.
   (3) වෙබ් අඩවියක් තිබීම අත්‍යවශ්‍ය වේ.
   (4) විකාශන කුළුණක් තිබීම අවශ්‍ය වේ.

30. සැම පසළොස්වක පොහෝ දිනකම විවිධ තේමා යොදා ගනිමින් ටෙලි නාට්‍යයක් විකාශනය කෙරේ. එය අයත්වන ටෙලි නාට්‍ය ප්‍රභේදය කුමක් ද?
   (1) ඒකාංගික (2) ප්‍රාසාංගික
   (3) විවිධාංගික (4) මෙගා

31. කිසියම් ප්‍රස්තුතයක් ඔස්සේ පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් අදහස් හුවමාරු කර ගන්නා ගුවන්විදුලි වැඩසටහන් ප්‍රභේදය වන්නේ,

(1) සාකච්ඡා යි. (2) සංවාද යි.

(3) සම්මුඛ සාකච්ඡා යි. (4) කථා යි.

32. ගුවන් විදුලි වැඩසටහන් ස්වරූපයේ කැපී පෙනෙන වෙනස්කම් ඇති කරමින් 90 දශකයේ ආරම්භ කළ පෞද්ගලික ගුවන්විදුලි සේවාවක් වන්නේ,

(1) සිරස ගුවන් විදුලි සේවාවයි. (2) දෙරණ ගුවන් විදුලි සේවාවයි.

(3) ලක් F.M ගුවන් විදුලි සේවාවයි. (4) සිටි F.M ගුවන් විදුලි සේවාවයි.

33. රූපවාහිනී මාධ්‍ය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කලා මාධ්‍යයකි. (2) සරල තාක්ෂණයක් භාවිත වේ.

(3) ඒකාකාරී අන්තර්ගතයක් සහිතය. (4) වෙළඳ ලෝකය නිවස තුළට කැඳවා ගෙන එයි.

34. 17 වන සියවසේ සෙවනැලි නාටක ප්‍රවර්ධනය වීම කෙරෙහි බලපෑවේ,

(1) දෘෂ්ටි අඛණ්ඩතා සිද්ධාන්තය භාවිතයට පැමිණීමයි.

(2) මැජික් ලන්තෑරුම සොයා ගැනීමයි.

(3) පැන්තස් මැගෝරියා නම් දර්ශන පෙන්වීමයි.

(4) නිශ්චල ඡායාරූප හඳුන්වා දීමයි.

35. ගුවන් විදුලියේ ආමන්ත්‍රණ ස්වරූපය විය යුත්තේ,

(1) පෞද්ගලික ඇමතුමක් ලෙසිනි. (2) පොදු ඇමතුමක් ලෙසිනි.

(3) ග්‍රාහක ප්‍රභේදයට යෝග්‍ය ඇමතුමක් ලෙසිනි. (4) ග්‍රාහක ක්ෂේත්‍රයට අමතන ලෙසිනි.

36. රැහැනකින් තොර ව පණිවිඩයක් යැවූ පළමු පුද්ගලයා වන්නේ,

(1) සැමුවෙල් එෆ්. බී. මෝස් ය. (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් ය.

(3) ගුග්ලි එල්මෝ මාකෝනි ය. (4) එඩ්වඩ් හාපර් ය.

37. හදිසි අනතුරක් පිළිබඳ ප්‍රවෘත්තියක් රචනයේදී ප්‍රවෘත්තියක මූල පාඨය සඳහා ඇතුලත් කිරීමට අවම ඉඩක් ඇත්තේ කුමන කරුණ ද?

(1) සිද්ධිය වූ වේලාව (2) සිද්ධිය වූ ආකාරය

(3) සිද්ධිය වූ ස්ථානය (4) සිද්ධියට භාජනය වූයේ කවුද

38. නොවැම්බර් 21 වැනි දිනය වැදගත් වන්නේ,

(1) ලෝක ගුවන්විදුලි දිනය සමරන නිසා ය.

(2) ලෝක රූපවාහිනී දිනය සමරන නිසා ය.

(3) ලංකාවේ ගුවන්විදුලිය ආරම්භ කිරීම නිසා ය.

(4) ලංකාවේ රූපවාහිනිය ආරම්භ කිරීම නිසා ය.

39. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදකයෙකු වූ කුෂාන්, කුමාරතුංග මුනිදාස මහතාගේ ගුණ අනුස්මරණ දිනය වෙනුවෙන් රූපවාහිනී වැඩසටහනක් ඉදිරිපත් කිරීමට තීරණය කළේ ය. ඒ සඳහා ඔහුට යොදා ගත හැකි යෝග්‍යතම වැඩසටහන් ප්‍රභේදය වන්නේ,

(1) ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් ය. (2) විචිත්‍රාංගමය වැඩසටහන් ය.

(3) වාර්තා වැඩසටහන් ය. (4) සඟරාමය වැඩසටහන් ය.

40. ජනමාධ්‍ය ආයතනවල ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ,

(1) රජයෙන් ලැබෙන ආදායම් ය.

(2) වෙළඳ දැන්වීම් හා අනුග්‍රාහකත්වය මත ලැබෙන ආදායම් ය.

(3) ජනමාධ්‍ය සතු වත්කම් මගින් ලැබෙන ආදායම් ය.

(4) සුබ පතන්නන්ගෙන් ලැබෙන අදායම් ය.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**11 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** | කාලය පැය 02 මි. 10 යි.

නම/ විභාග අංකයඃ

<u>වැදගත් :</u>
- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. ජනමාධ්‍ය ප්‍රබල සමාජ සන්නිවේදන කාර්යයක් ඉටු කරයි.

(i) පුවත්පත, ගුවන්විදුලිය, රූපවාහිනිය යන මාධ්‍ය භාවිතයෙන් සිදු කරන සන්නිවේදන වර්ගය නම් කරන්න.

(ii) ජනමාධ්‍ය සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා යන සංදේශ පාලනය කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන සංකල්පය කුමක් ද?

(iii) පුවත්පත් මාධ්‍ය ආයතනයක කාර්යාලයක් තුළ තිබිය යුතු කාර්යාලීය මාධ්‍ය උපකරණ දෙකක් ලියන්න.

(iv) පුවත්පතක ප්‍රධාන මාධ්‍යවේදියා හඳුන්වන නම කුමක් ද?

(v) ජනමාධ්‍ය මඟින් සමාජ ප්‍රතිරූප ගොඩනගන කණ්ඩායම් දෙකක් දක්වන්න.

(vi) ප්‍රවෘත්ති ඡායාරූපයක වටිනාකම තීරණය වීම කෙරෙහි බලපාන සාධක දෙකක් ලියන්න.

(vii) තොරතුරු රැස් කිරීමේ දී භාවිත කරන ශිල්ප ක්‍රම දෙකක් දක්වන්න.

(viii) ගුවන්විදුලි මධ්‍යස්ථාන සිය සම්ප්‍රේෂණ කටයුතු සඳහා බහුලව යොදාගන්නා ගුවන් විදුලි තරංග වර්ග දෙකක් ලියන්න.

(ix) රූපවාහිනී යථාකාර වැඩසටහන්වල ලක්ෂණ දෙකක් ලියන්න.

(x) ජනමාධ්‍ය තුළ පොදුවේ දැකිය හැකි අර්ථ බාධක දෙකක් දක්වන්න. (ලකුණු 02 × 10 = 20)

(02) ජංගම දුරකථනය වර්තමානයේ අත්‍යවශ්‍ය උපාංගයක් වී ඇත.

(i) ජංගම දුරකථනයක් මඟින් තොරතුරු හුවමාරු කිරීමට අමතරව ඔබ ලබා ගන්නා පහසුකම් දෙකක් ලියන්න. (ල. 01)

(ii) ජංගම දුරකථනය භාවිතයෙන් සිදු වන සන්නිවේදන වර්ගයේ ලක්ෂණ හතරක් ලියන්න. (ල. 02)

(iii) ජංගම දුරකථනය මඟින් ඡායාරූප ගැනීමේ වාසි තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 03)

(iv) ජංගම දුරකථන භාවිතයේදී ඇති කර ගත යුතු යහ පුරුදු හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

(03) මුද්‍රිත මාධ්‍යය ද නව තාක්ෂණයත් සමඟ පුළුල් වෙමින් පවතියි.

(i) අන්තර්ජාල පාඨකයන් භාවිත කරන විද්‍යුත් පුවත්පත් ප්‍රභේද දෙක නම් කරන්න. (ල. 01)

(ii) පොතක් හා පුවත්පතක් අතර දැකිය හැකි වෙනස්කම් දෙකක් දක්වන්න. (ල. 02)

(iii) පුවත්පත් අන්තර්ගතය තුළ දැකිය හැකි පහත ආකෘති කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(a) සංස්කාරක වැකිය (b) කාටූන් (c) දැන්වීම්

(iv) ප්‍රවෘත්ති රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු හතරක් විස්තර කරන්න. (ල. 04)

(04) මානවයා සමාජ ජීවිතයේ දී සෑම සන්නිවේදන වර්ගයකම නිරත වන අතර සෑම සන්නිවේදන ස්වරූපයක් ම භාවිත කරයි.

(i) ඔබ සමූහ සන්නිවේදනයේ යෙදෙන අවස්ථා දෙකක් ලියන්න. (ල. 01)

(ii) සාම්ප්‍රදායික සමාජයේ දෘශ්‍ය සන්නිවේදනය යොදා ගත් ආකාරය උදාහරණ දෙකක් මඟින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

(iii) ආයතනයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වේ. කරුණු 03 ක් ඇසුරින් සනාථ කරන්න.

(ල. 03)

(iv) ජනසන්නිවේදනයේ මූලික ස්වභාවය කරුණු 04 ක් මඟින් පැහැදිලි කරන්න. (ල. 04)

(05) රාජ්‍ය මාධ්‍ය ආයතනවලට වඩා පෞද්ගලික මාධ්‍ය ආයතන ශීඝ්‍ර ලෙස බිහි වෙමින් පවතියි.

(i) එයට බලපාන ප්‍රධානතම හේතුව කුමක් ද? (ල. 01)

(ii) රූපවාහිනී මාධ්‍ය මඟින් සමාජයට එල්ල කර ඇති ධනාත්මක බලපෑම් දෙකක් ලියන්න (ල. 02)

(iii) මාධ්‍ය ආයතනයකට සම්බන්ධ මාණ්ඩලික මාධ්‍යවේදීයෙකුගේ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ල. 03)

(iv) ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය කෙරෙහි රජය බලපෑම් කරන ආකාර හතරක් විස්තර කරන්න.

(ල. 04)

(06) (i) සංජානනය යනු කුමක් ද? (ල. 01)

(ii) ග්‍රාහකයාගේ සංජානන ක්‍රියාවලියට බාධා පැමිණෙන හේතු දෙකක් ලියන්න. (ල. 02)

(iii) සන්නිවේදනයේ ඓතිහාසික වර්ධනය තුළ සිදු වූ වැදගත් අවස්ථා තුනක් පැහැදිලි කරන්න.

(ල. 03)

(iv) ලැස්වෙල් ආකෘතියේ මූලිකාංග හතරක් විස්තර කරන්න. (ල. 04)

(07) (i) ඡායාරූපකරණය සම්බන්ධ වෘත්තීන් දෙකක් නම් කරන්න. (ල. 01)

(ii) රටක ජනතාව තුළ සංවර්ධනාත්මක චින්තනය ඇති කිරීමෙහිලා ජනමාධ්‍යයට මැදිහත්විය හැකි ආකාර දෙකක් දක්වන්න. (ල. 02)

(iii) පහත සඳහන් තේමා තුනට අදාළ ව ආගමික හා සදාචාරාත්මක නියෝජනය සිදු කරන ආකාරය පැහැදිලි කරන්න. (ල. 03)

(a) ආගම

(b) ගැටුම් හා සාමය

(c) මානව ධර්මතා

(iv) වෘත්තිමය ඡායාරූප ශිල්පියෙකු සතු විය යුතු ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ල. 04)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(3) | 5 -(2) | 6 -(2) | 7 -(4) | 8 -(3) | 9 -(4) | 10 -(3) |
| 11-(1) | 12 -(4) | 13 -(1) | 14 -(2) | 15 -(3) | 16 -(2) | 17 -(3) | 18 -(1) | 19 -(4) | 20 -(4) |
| 21-(2) | 22 -(2) | 23 -(3) | 24 -(2) | 25 -(4) | 26 -(1) | 27 -(4) | 28 -(4) | 29 -(4) | 30 -(3) |
| 31-(1) | 32 -(1) | 33 -(4) | 34 -(2) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(2) | 39 -(3) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. (i) ජනසන්නිවේදනය
(ii) දොරටුපාල සංකල්පය.
(iii) දින මුද්‍රා යන්ත්‍රය/ නිල මුද්‍රා යන්ත්‍රය/ පරිගණකය
(iv) ප්‍රධාන කර්තෘ
(v) දේශපාලඥයන්/ නළු නිලියන්/ ක්‍රීඩකයන්/ පාතාල කණ්ඩායම්වල නායකයන්
(vi) කාලෝචිත බව/ කැපී පෙනීම / බලපෑම/ සමීපතාව/ මානව ඇල්ම/ අසාමාන්‍ය බව
(vii) සම්මුඛ සාකච්ඡා/ ප්‍රශ්නාවලී/ නිරීක්ෂණ/ ලේඛන පරිශීලනය/ බුද්ධි කලම්භනය
(viii) කෙටි තරංග/ මධ්‍යම තරංග/ සංඛ්‍යාත මූර්ජන තරංග
(ix) පිටපත් සකස් නොකිරීම/ සංස්කරණය නොකිරීම
(x) ප්‍රාදේශීය භාෂා ව්‍යවහාර භාවිත කිරීම/ කෙටි යෙදුම් භාවිත කිරීම / සිංහල ඉංග්‍රීසි ආදි භාෂා සම්මිශ්‍රව භාවිත කිරීම/ විදග්ධ වදන් භාවිත කිරීම ආදිය (ලකුණු 02 × 10 = 20)

02. (i) නිශ්චල ඡායාරූප ගැනීම/ දර්ශන වීඩියෝ කිරීම/ ගුවන්විදුලියට සවන්දීම, රූපවාහිනිය නැරඹීම/ අන්තර්ජාල පහසුකම් ලබා ගත හැකි වීම/ ගණක යන්ත්‍රයක් ලෙස භාවිතයට ගැනීම/ සංගීතයට සවන්දිය හැකිවීම/ එලාම් ඔරලෝසුවක් ලෙස භාවිතයට ගැනීම ආදිය (ල. ½ x 2 = 01)
(ii) පුද්ගලයින් දෙදෙනෙකු අතර සිදු වීම/ ප්‍රතිචාර ප්‍රතිපෝෂණය ක්ෂණික වීම/ සජීවී බව/ වාචික මෙන්ම නිර්වාචිකව සන්නිවේදනයේ යෙදිය හැකි වීම/ සන්නිවේදන බාධක අවම වීම/ තාක්ෂණික උපකරණ ද භාවිත කළ හැකි වීම/ මුහුණට මුහුණලා සන්නිවේදනය සිදු වීම සන්නිවේදක ග්‍රාහක භූමිකා හුවමාරු වීම ආදිය (ල. 1x2 =02)
(iii) අනවශ්‍ය ඡායාරූප මකා දැමිය හැකිවීම / ලබාගත් ඡායාරූප එම අවස්ථාවේම නැරඹිය හැකි වීම/ සේයා පටල ආදිය මිලදී ගැනීමට සිදු නොවන නිසා භාවිතය ලාබදායි වීම/ පහසුවෙන් පරිගණකය හා සම්බන්ධ කළ හැකි නිසා කාර්යක්ෂමව සංස්කරණය කිරීමේ පහසුව/ විද්‍යුත් තැපැල, අන්තර්ජාලය වැනි සන්නිවේදන ජාලයන්ට පහසුවෙන් යොමු කළ හැකි වීම ආදිය (ල. 1x3 =03)
(iv) ⋆ ඇමතුම ලබා ගන්නා තැනැත්තා පළමුවෙන්ම තම අනන්‍යතාව හෙළි කිරීම.
⋆ දෙපාර්ශවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි වචන භාවිතය
⋆ කිය යුතු දේ කෙටියෙන් කීම
⋆ අන් අයට බාධා වන පරිදි භාවිත නොකිරීම
⋆ තමා නොදන්නා අතහැරුණු ඇමතුම්වලට ඇමතීමෙන් වැළකීම
⋆ පෞද්ගලික ජීවිතයට බාධාවක් කර නොගැනීම
⋆ පොදු ස්ථානවලදී දුරකථනය ක්‍රියා විරහිත කර හෝ නිහඬ (Silent mode) කර තැබීම ආදිය(ල. 1x4 =04)

03. (i) ⋆ මුද්‍රිත පුවත්පතෙහිම විද්‍යුත් පිටපත
⋆ අන්තර්ජාලයෙහිම පමණක් පළ කෙරෙන විද්‍යුත් පුවත්පත් (ල. ½ x 2 =01)
(ii) ⋆පොතක් ඝන පිටකවරයකින් සමන්විත වේ. ඇතුළු පිටු තදින් එකට බැඳ තිබේ. පුවත්පතක් කටු ගසා අමුණා නොමැති අතර පිටකවරයකින් ද සමන්විත නොවේ.
⋆ පොතක අන්තර්ගතය එකිනෙකට වෙනස් වන අතර ඒවා අධ්‍යාපන, නව කථා, කෙටි කතා ආදී විවිධ ක්ෂේත්‍ර පාදක කොට ගෙන රචනා වේ. පුවත්පත්වල බොහෝ විට කාලීන තොරතුරු ඇතුළත් වේ.
⋆ පුවත්පත්වල භාවිතය කෙටිකාලීන වන අතර පොතක් දීර්ඝ කාලයක් භාවිත කෙරේ. (ල. 1x2 =02)
(iii) ⋆ සංස්කාරක වැකිය, කාටුන්, දැන්වීම් පිළිබඳව විස්තර කළ යුතුය (ල. 1x3 =03)
(iv) ⋆ සාරාංශගත තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම
⋆ වියරණ නීති, අක්ෂර වින්‍යාස, නිවැරදි භාෂා රටා අනුගමනය කිරීම
⋆ පෙළ ආරම්භය ඉලක්කම්වලින් සිදු නොකිරීම
⋆ අතීතය සඳහන් කරමින් පෙළ ආරම්භ නොකිරීම
⋆ $W_5H$ සංකල්පය අනුව මූල පාඨය රචනා කිරීම ආදිය (ල. 1x4 =04)

04. (i) සමිති සමාගම්වලදී / ධර්ම දේශනා අවස්ථාවලදී/ පාසලේ උදය රැස්වීමේ / පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලදී/ සංගීත සංදර්ශනයකට සහභාගි වීමේදී / සම්මන්ත්‍රණ, වැඩමුළුවලට සහභාගි වීමේදී (ල. ½ x 2 = 01)

(ii) ⋆ ගින්දර දැල්වීම ⋆ දුම් යැවීම ⋆ ගස්වල කොළ අතු එල්ලීම
⋆ චිත්‍ර ඇඳීම, නර්තනයන් මගින් අත්දැකීම් ප්‍රකාශ කිරීම ආදිය. (ල. 1x2 =02)

(iii) ⋆ මෙහෙයවන්නෙකු සිටීම ⋆ නිශ්චිත ධූරාවලියක් සහිත වීම
⋆ නිල ස්වභාවයක් පැවතීම ⋆ නිශ්චිත කාලයක්, ස්ථානයක් පැවතීම
⋆ පිළිගැනීම් හා නියමයන් මත ක්‍රියාත්මක වීම
⋆ සංදේශ ක්‍රමානුකූලව හෙමින් ගලා යාම ආදිය (ල. 1x3 =03)

, (iv) ⋆ සංදේශය පොදු වීම ⋆ සන්නිවේදකයා හා ග්‍රාහකයා අභිමුඛ නොවීම
⋆ සංවිධිත ආයතනයක් මඟින් ක්‍රියාත්මක වීම
⋆ ග්‍රාහකත පද්ධතිය ඉතා විශාල හා පැතුරුණු ස්වභාවයක් ගැනීම
⋆ වෘත්තීය සන්නිවේදකයන් සිටීම. ⋆ තාක්ෂණික උපකරණ භාවිත කිරීම
⋆ සන්නිවේදක ග්‍රාහක භූමිකා දුරස්ථ වීම ⋆ ග්‍රාහක ප්‍රතිචාර ප්‍රමාද වීම (ල. 1x4 =04)

05. (i) ලාබ උපයන කර්මාන්තයක් බවට මාධ්‍ය පත්ව තිබීම (ල. 01)

(ii) ⋆ යහපත් චර්යාවන්ට පෙළඹවීම
⋆ යහපත් ආකල්ප වර්ධනයට පෙළඹවීම
⋆ අධ්‍යාපනයට පෙළඹවීම
⋆ පෞරුෂය වර්ධනය කිරීම.
⋆ යහපත් වූ සමාජානුයෝජනයක් සඳහා පෙළඹවීම ආදිය (ල. 1x2 =02)

(iii) ⋆ වෘත්තීය මාධ්‍යවේදියෙක් විම
⋆ මාසිකව වැටුප් ලබන අයෙක් වීම
⋆ ආයතනය තුළ හෝ ආයතනය විසින් යොදවන කාර්යයක නිරත විය යුතු පුද්ගලයෙකු වීම
⋆ දීර්ඝ කාලයක් සේවය කිරීමෙන් ඉහළ තනතුරුවලට පත්විය හැකිවීම (ල. 1x3 =03)

(iv) ⋆ බලපත්‍ර ලබා දීමෙන්
⋆ සංදේශ වාරණය කිරීම/ පාලනය කිරීම මගින්
⋆ ආයතනවලට මුද්‍රා තැබීම මගින්
⋆ බදු පැනවීම මගින්
⋆ රාජ්‍ය මාධ්‍ය ආයතනවලට මාධ්‍යවේදීන් පත් කිරීම හා පරිපාලනය සම්බන්ධයෙන් කටයුතු කිරීම මගින් (ල. 1x4 =04)

06. (i) කෙනෙකුගේ පංචේන්ද්‍රයන් මගින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම සංජානනයයි. (ල. 1)

(ii) ⋆ සංදේශය තුළ විවිධාර්ථ තිබීම
⋆ වැරදි ලෙස තොරතුරු ගොනු කර සංදේහ සැකසීම
⋆ සංදේශයේ තොරතුරු විකෘති වී තිබීම
⋆ ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලයට නොගැළපීම (ල. 1x2 =02)

(iii) ⋆ කථන භාෂාවක් බිහිකිර ගැනීම ⋆ අක්ෂර නිර්මාණය කර ගැනීම
⋆ හෝඩිය නිර්මාණය කර ගැනීම ⋆ විවිධ දෑ යොදාගෙන ලිවීම
⋆ කඩදාසි නිර්මාණය කර ගැනීම ⋆ මුද්‍රණය ආරම්භ කිරීම
⋆ විදුලි හා විද්‍යුත් සංඥා තාක්ෂණය බිහි වීම ආදි කරුණු තුනක් (ල. 1x3 =03)

(iv) සන්නිවේදකයා / ග්‍රාහකයා / සන්දේශය / මාධ්‍ය / බලපෑම යන මූලිකාංගවලින් හතරක් විස්තර කිරීම. (ල. 04)

07. (i) රූපගත කිරීම් සහායක/ ආලෝකකරණ ශිල්පී/ ඡායාරූප මුද්‍රණ ශිල්පී/ ඡායාරූප සංස්කරණ ශිල්පී/ ඡායාරූප කර්තෘ/ ඡායාරූප නිමවුම් ශිල්පී (ල. ½ x 2 = 01)

(ii) ⋆ සංවර්ධනාත්මක චින්තනය ඇතුළත් ගීත, නාට්‍ය ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කිරීම
⋆ පුවත්පත් කාටුන්, වෙළඳ දැන්වීම් මගින් සංවර්ධනාත්මක චින්තනය පෝෂණය වන අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම
⋆ සාර්ථක ගොවිබිම්, කර්මාන්ත නිෂ්පාදන, ස්වයං රැකියා මගින් ජයග්‍රහණ අත්පත් කරගත් පුද්ගලයන් ආදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම ආදිය (ල. 1x2 =02)

(iii) ආගමික හා සදාචාරාත්මක නියෝජනය යටතේ ඇති ආගම, ගැටුම් හා සාමය, මානව ධර්මතා යන පැතිකඩයන් විස්තර කළ යුතුය. (ල. 1x3 =03)

(iv) ⋆ ඡායාරූප ශිල්පය පිළිබඳ ප්‍රමාණවත් දැනුම ⋆ නිර්මාණශීලී වීම
⋆ නව තාක්ෂණය හා අත්වැල් බැඳ ගැනීම ⋆ ඉගෙනීමට ඇති කැමැත්ත
⋆ කලට වේලාවට වැඩ කිරීම
⋆ සුහදශීලීව අන්‍යයන් සමඟ කටයුතු කිරීමේ හැකියාව
⋆ ආචාරශීලී බව, නීතිමය හා සදාචාරාත්මක සීමාවන් හඳුනාගෙන කටයුතු කිරීම
⋆ මනා කළමනාකරුවෙකු වීම
⋆ සේවා දායකයාගේ අපේක්ෂා හා ප්‍රතිචාර වෙත නම්‍යශීලී වීම (ල. 1x4 =04)